විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් සභා රාජ්‍ය සේවයක්

# පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත

## மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு – மேல் மாகாணம்

## PROVINCIAL COUNCIL PUBLIC SERVICE COMMISSION – WESTERN

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரிய No.628,10th Floor,Jana Jaya City Building,NawalaRoad,Rajagiriya

| මගේ අංකය / எனது இல. / My Ref. | WPC/PSC/REC01/16/LAB.TEC. | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2025.06. 30 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් (බ.ප.),
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප.),
ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.),
ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.),
ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.),

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2025**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය සඳහා පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව අදාල අයදුම්පත් 2025.07.21 දිනට පෙර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. (අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා ආදර්ශ අයදුම්පත මේ සමඟ අමුණා ඇත.)

03. මෙම අයදුම්පත බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk මඟින් බාගත කර ගත හැක.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

Tel – 0112879614
Fax – 0112879512
email – ppscwprec@sltnet.lk

## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියේ තනතුර සඳහා වන බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය -2025

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියේ තනතුර සඳහා වන බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය සඳහා පහත සුදුසුකම් ලත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ, නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** **වැටුප් පරිමාණය :**

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ච. 10/2025 අනුව රු.52250 – 10 x 800 – 11 x 1190- 10 x 1320 -10 x 1350 – 100040/ වේ. වැටුප් කේත අංකය MN 3 -2025 වේ.

**03.** **සේවා කොන්දේසි :**

a. අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

b. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය.

c. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයටද, රජයේ හා බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද, රජයේ හා බස්නාහිර පළාත් සභාවේ වෙනත් රෙගුලාසි වලටද, චක්‍රලේඛ හා උපදෙස් වලටද, ඒවාට අදාළ වරින් වර නිකුත් කරනු ලබන සංශෝධන වලටද ඔබ යටත් විය යුතු වේ.

**04.** **පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන් :**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී තනතුරෙහි මුළු පුරප්පාඩු 03 ක් පවතී. 100% සීමිත බඳවා ගැනීමකි. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**4.1** **අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2025.07.21 දින වේ.**

**05.** **සුදුසුකම් :**

**5.1.** **අධ්‍යාපන සුදුසුකම්**

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 06 කින් සමත්ව තිබීම.

**5.2 වෘත්තීය සුදුසුකම්**

ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ රසායන විද්‍යාව පිළිබඳ රසායනාගාර තාක්ෂණවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ අධිකාරී සාමාජිකත්වය (L.I.Chem C.) ලබා තිබීම.

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත් රසායන විද්‍යාව/ රසායනාගාර විද්‍යාව විෂයය ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් රසායන විද්‍යාව/ රසායනාගාර විද්‍යාව පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් ලබා තිබීම.

**5.3 පළපුරුද්ද**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ PL 1 වැටුප් බණ්ඩය හෝ ඉන් ඉහළ වැටුප් බණ්ඩයේ තනතුරක වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබිය යුතුය. පාලන චක්‍රලේඛ අංක 04/2021 අනුව විනය දඬුවම් ලබා නොතිබිය යුතුය.

**5.4 කායික සුදුසුකම්**

තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත වීම.

**5.5 වයස් සීමාව**

දැනටමත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු වූවන්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාවක් අදාල නොවේ.

**5.6 වෙනත්**

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**06. බඳවා ගැනීමේ ක්‍රමය :**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියේ තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව ලිඛිත පරීක්ෂණයක් පවත්වා එහිදී ලබා ගන්නා ලකුණු කුසලතා අනුපිළිවෙල මත හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

**මෙම තනතුර සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය 2025.07.21 දින වේ.**

07. ලිඛිත විභාගය :

7.1 ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය01 | 100 | 40 |
| විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 | 40 |

7.2 විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම පිළිබඳ ඇගයීමේ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි . |
| විෂයානුබද්ධ දැනුම | <u>රසායනාගාර තාක්ෂණය පිළිබඳ මූලධර්ම</u><br>ආහාර වල මූලික සංඝටක - තෙතමනය, මේදය, ප්‍රෝටීන, ඛනිජ ලවණ,කාබෝහයිඩ්‍රේට් ප්‍රතිශත නිර්ණය කිරීම.<br>අනුදත්ත පරීක්ෂාව - පිෂ්ඨ වර්ග පරීක්ෂාව, කිරි විශ්ලේෂණය,මාංශමය ආහාර වර්ග විශ්ලේෂණය, ජෑම් කෝඩියල් හා අනෙකුත් පළතුරු නිෂ්පාදන විශ්ලේෂණය, විනාකිරි විශ්ලේෂණය, තෙල් හා මේද පරීක්ෂාව, පානීය ජල පරීක්ෂාව හා අපජල පරීක්ෂාව පිළිබඳ දැනුම.<br><br><u>රසායනාගාර ආරක්ෂාව</u><br>උපකරණ භාවිතය, විබාදක රසායන ද්‍රව්‍ය භාවිතය හා විශ්ලේෂිත සාම්පල ඉවත් කිරීම පිළිබඳ දැනුම. |

08. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු

මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ.ලකුණු ලබා දෙනු නොලැබේ.

පත්කිරීම් බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

09. විභාග ගාස්තු :

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු 1200/= කි. විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත් සභාව තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ.

**10. විභාගයට ඇතුලත්වීම :**

(අ) නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

**11. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

**12. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරිම :**

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඔහු/ ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්,එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් වුවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 58 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

**13. විභාග ක්‍රමය :**

I. අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවල එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය.
II. මෙම විභාගය දක්වනු ලබන ඉදිරි දිනයකදී පවත්වනු ලැබේ.

14. අයදුම් කිරීමේ ක්‍රමය :

අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් A4 ප්‍රමාණයේ පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2025.07.21 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ " ලේකම්, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැඟිල්ල,නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය-2025 (සීමිත)" යන්න පැහැදිලි ලෙස සඳහන් කර තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් මඟින් ඔවුන්ගේ නිර්දේශ සහිතව එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

I. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

II. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.


තිලක් සෙනරත්,
ලේකම්,
**පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**බස්නාහිර පළාත.**

**දු.ක.** - 011 2879614
**ෆැක්ස්** - 011 2879512
**ඊ-මේල්** - ppscwprec@sltnet.lk

## ආදර්ශ අයදුම් පත්‍රය

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණිය තනතුර සඳහා වන බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය -2025**

විභාග අංකය [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

සිංහල - S
දෙමළ - T [ ]
ඉංග්‍රීසි - E

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -..............................................................
..............................................................................................................

(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :
..............................................................................................................

(උදා : H.M.S.K.GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) -..............................................................
..............................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02. 2.1 ස්ත්‍රී/ පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ √ යොදන්න)

පුරුෂ - [ ] ස්ත්‍රී - [ ]

03. 3.1 විවාහක/ අවිවාහක බව - (විවාහක - 2, අවිවාහක - 1)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න) [ ]

3.2 උපන් දිනය

වර්ෂය: [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස - අවුරුදු :..................මාස.............දින......

04. 4.1 ස්ථිර ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

..............................................................................................................................

..............................................................................................................................

ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්)

..............................................................................................................................

..............................................................................................................................

4.2 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය:

i. සිංහලෙන්/ දෙමළෙන්-

..............................................................................................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින්-

..............................................................................................................................

4.3 දුරකථන අංකය:

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| රාජකාරී | | | | | | | | | | |
| ජංගම | | | | | | | | | | |

❖ විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මඟින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න. SMS පණිවිඩ නොලැබීම සම්බන්ධයෙන් පසුව කරනු ලබන පැමිණිලි සලකනු නොලැබේ.

05. 5.1 දැනට දරණ තනතුර:..............................................................................

5.2 එම තනතුර ස්ථිරද, තාවකාලිකද, අනියම්ද යන්න:.................................................

5.3 එම තනතුරට පත් වූ දිනය:..............................................................................

5.4 සේවය ස්ථිර කල දිනය:..............................................................................

5.5 බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කල දිනය:..........................................

5.6 සේවා ස්ථානයේ නම සහ ලිපිනය:.......................................................................

5.7 වැටුප් බණ්ඩය:..............................................................................

5.8 පලපුරුද්ද:( අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 5.3 අනුව සේවා පලපුරුද්ද පිළිබඳ)

..............................................................................................................................

06. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ දැනට දරණ තනතුරේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය පිළිබඳ විස්තර හා පාලන චක්‍රලේඛ 04/2021 සම්බන්ධ තොරතුරු

6.1 තනතුරේ සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද?...............................................

6.2 වැටුප් රහිත නිවාඩු / වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේද?......................................

6.3 වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබේද?...............................

6.4 නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්ව තිබේද? යන්න........................

6.5 පාලන චක්‍රලේඛ 04/2021 අනුව විනයානුකූලව කටයුතු කර තිබේද? විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර තිබේද?...................................................................

6.6 ඉහත 6.5 සඳහා පිළිතුර "ඔව්" නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.

.............................................................................................................

**07.** **අධ්‍යාපන සුදුසුකම්:**

7.1 අධ්‍යාපන පොදු සහතික පත්‍ර (අ.පො.ස. (සා./පෙළ.)) පිළිබඳ විස්තරය

| | පළමු අවස්ථාව | | දෙවන අවස්ථාව | |
|---|---|---|---|---|
| i විභාගයේ වර්ෂය හා මාසය | | | | |
| ii විභාග අංකය | | | | |
| iii ප්‍රතිඵල | <u>විෂයය</u> | <u>සාමාර්ථය</u> | <u>විෂයය</u> | <u>සාමාර්ථය</u> |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

7.2 විභාග නිවේදනයේ 5.2 ඡේදය ප්‍රකාරව මේ විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති වෘත්තීය සුදුසුකම් සම්බන්ධ පාඨමාලාව / සුදුසුකම් පිළිබඳ විස්තර

i. විශ්ව විද්‍යාලය/ ආයතනය :...........................................................
ii. ඩිප්ලෝමාවේ නම :...........................................................
iii. ඩිප්ලෝමාව සම්පූර්ණ කළ දිනය :...........................................................
iv. ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ අධිකාරී සාමාජිකත්වය ලබා තිබේද?...................
v. වෙනත් සුදුසකම් :...........................................................

(ඉහතින් දක්වා ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල වන සහතික/ ලේඛන අමුණන්න)

08. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :...........................................................

ලදුපත් අංකය:...........................................................................................

දිනය:...........................................................................................

| ලදුපත මෙම කොටුව තුල නොගැලවෙන සේ අලවන්න. |
| --- |

(ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලද බ.ප.1 ලදුපත පමණක් වලංගු වේ.)

09. <u>අයදුම්කරුගේ සහතිකය</u>

...........................................................................................................

...........................................................................................................

වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය................................ ................................

අයදුම්කරුගේ අත්සන

10. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

(අනවශ්‍ය වචන කපා හරින්න)

.................................................................... මහතා/ මිය/ මෙනවියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව .................................... දින සිට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ .................................... තනතුරක සේවය කරන බවත් PL 1 වැටුප් බණ්ඩයේ / ඊට ඉහල වැටුප් බණ්ඩයක වැටුප් ලබන බවත් .................................. දින සිට සේවය ස්ථිර කර ඇති /නැති බවත් .......................... දිනට වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්,........................................... දිනට කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර ඇති බවත්,එම කාල සීමාව තුළ සියලුම වැටුප් වර්ධක නිසි පරිදි උපයාගෙන ඇති/නැති බවත්, වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇති/නැති බවත්, ඔහුට /ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති /ඇති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති /ඇති බවත්, සහතික කරමි.

2. අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බව සහතික කරන අතර අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුව මෙම නිලධාරියා/ නිලධාරිනිය සුදුසුකම් සපුරා ඇති බව ද නිර්දේශ කරමි.

දිනය..........................................                ..........................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

11. **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව .................................................................... මහතා /මිය/ මෙනවිය සියළු සුදුසුකම් සපුරා ඇති බැවින් අයදුම්පත නිර්දේශ කරමි. මෙම විභාගයේ ප්‍රතිඵල මත පත්වීමක් සඳහා ඔහු /ඇය තෝරා ගතහොත් ඔහු/ ඇය දැනට දරණ තනතුරින් නිදහස් කරන බවද ඉහත ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

දිනය....................................................                ...............................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ලිපිනය................................................

12. **ප්‍රධාන ලේකම්/ අමාත්‍යාංශ ලේකම් (බ.ප.) ගේ නිර්දේශය**

ඉහත අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය....................................................                ...............................................

ප්‍රධාන ලේකම්/ අමාත්‍යාංශ ලේකම්(බ.ප.) අත්සන හා නිල මුද්‍රාව

ලිපිනය................................................